www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මැතිවරනයෙන් අඩමාන පාර්ලිමේන්තුවක් හා දේශපාලන අස්ථාවරත්වය උග්‍ර වීමක්

**Sri Lankan election produces a hung parliament and further political instability**

**කේ. රත්නායක විසිනි**
**2004 අප්‍රේල් 5**

ශ්‍රී ලංකාවේ පසුගිය සිකුරාදා පැවති මැතිවරනය, අවිනිශ්චිත ප්‍රතිඵලයක් ජනිත කොට ඇති අතර එය තුඩු දිය හැක්කේ දේශපාලන දඟනශීලීත්වය තව දුරටත් උත්සන්න කිරීමටයි. ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස), එක්සත් ජාතික පෙරමුනේ (එජාපෙ) වියදමින්, ආසන 225කින් යුත් පාර්ලිමේන්තුව තුල සිය තත්වය ඉහල දමා ගෙන ඇති නමුදු, එකදු පක්ෂයකට හෝ සන්ධානයකට වත් පැහැදිලි බහුතරයක් හිමිව නැත.

පෙබරවාරි 7 දා, කුමාරතුංග, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග සාම සාකච්ඡා පවත්වාගෙන යාම පිලිබඳව, අගමැති රනිල් වික්‍රමසිංහ සමග පැවති ගැටුම විසඳාගැනීමේ අපේක්ෂාවෙන්, එජාපෙ ආන්ඩුව බලයෙන් පහ කරමින්, මහ මැතිවරනයට පාර කැපුවා ය. එහෙත් කොලඹ පාලක පැලැන්තිය තුල පැවති කටුක කන්ඩායම් පොරය විසඳාලනු වෙනුවට, මැතිවරනය තුඩු දී ඇත්තේ දේශපාලන අර්බුදය උත්සන්න කිරීමට ය.

තමන්ගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) විශ්වාසනීයත්වය කඩාවැටීම මුක්කු ගසා රැක ගැනීමේ මංමුලාගත ප්‍රයත්නයක යෙදෙමින්, කුමාරතුංග, සිංහල වර්ගෝත්තමවාදයේ හා ජනතාවාදී වාචාලත්වයේ ප්‍රතිගාමී කවලමක් මත පාදක වී සිටින, ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග සන්ධානයක් තනා ගත්තා ය. එජනිස දේශපාලන පක්ෂයක් ලෙස නිල වසයෙන් ලියාපදිංචි කෙරුනේ, ආන්ඩුව බලයෙන් පහ කිරීමට යන්තම් දිනකට පෙර ය.

මැතිවරනයෙන් එජනිස ආසන 105ක් දිනාගත්තේ ය. කෙසේ වෙතත්, ලොකු ම වාසිය ඩැහැගත්තේ, ශ්‍රීලනිප නො ව, ජවිපෙ ය. එය, සිය පාර්ලිමේන්තු බලය ආසන 16 සිට 40 දක්වා දෙගුනයකට වඩා වැඩි ප්‍රමානයකින් ඉහල දමා ගත්තේ, මැතිවරන දිස්ත්‍රික්ක ගනනාවක, ප්‍රධාන ශ්‍රීලනිප අපේක්ෂකයන් අභිභවා, මනාප ලැයිස්තුවල මුලටම පැමිනෙමිනි. එය, දැන් එජනිස ඇමති මන්ඩලය තුල බලගතු නියෝජනයක් ඉල්ලා සිටිය හැකි තත්වයක සිටී. අනෙක් අතට, ශ්‍රීලනිපයේ පදනම් වියැකී, එහි ආසන ගනන 77 සිට යන්තම් ආසන 60 ඉක්ම වූ මට්ටමක් දක්වා වැටී ඇත.

ශ්‍රීලනිපයේ සෙසු සගයන් වන ලංකා සමසමාජ පක්ෂය (ලසසප) සහ කොමියුනිස්ට් පක්ෂය (කොප), කිසි ම වාසියක් අත්පත් කරගැනීමට සමත්ව නැත. මෙම පැරනි කම්කරු පක්ෂ, 2001 මැතිවරනයේ දී මුලුමනින්ම පාහේ අතුගෑවී ගියේ ය. කොප මෙවර යන්තම් එක ආසනයක් ජය ගෙන ඇති අතර, ආසන තුනක් තරග කල ලසසප, එකදු ආසනයක් වත් දිනාගැනීමට අසමත්ව තිබේ.

ජවිපෙ ප්‍රථම වතාවට ආන්ඩුවකට ඇතුලු වීම, දේශපාලන ආතතීන් තව දුරටත් උත්සන්න කරනු ඇත. තමන් සටන් විරාමයට ගරු කරන බවටත් එල්ටීටීඊය සමග සාකච්ඡා යලි අරඹන බවටත් එජනිසයේ කියාපෑම් තිබිය දී ම, දෙමල සුලුතරයට මොන යම් හෝ සහනයක් දීමට ජවිපෙ දක්වන සතුරු භාවය, "සාම ක්‍රියාදාමයට" වල කපා රට යලි සිවිල් යුද්ධයට ඇද දැමීමේ තර්ජනය මතු කරයි. මාස ගනනාවක් තිස්සේ, ජවිපෙ කතිකයෝ, එල්ටීටීඊය සමග ගෙනගිය සාකච්ඡාවල දී රට පාවා දී ඇතැයි එජාපෙ ආන්ඩුව හෙලා දැකීමේ යෙදී සිටී.

ජවිපෙට ලැබුනු ඡන්ද මගින් පිලිඹිබු වන්නේ, ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක ම — ශ්‍රීලනිප හා වික්‍රමසිංහගේ එක්සත් ජාතික පක්ෂය (එජාප) — සමග මහජනතාව පුලුල් පරිමානව විරසක වී ඇති බවයි. එජාපෙ ඡන්ද ප්‍රමානය, ජාතික පරිමානව ගත් කල, යන්තම් සියයට 38ක් දක්වා සියයට 7කින් වැටුනු අතර, පාර්ලිමේන්තුව තුල පක්ෂයට හිමි ආසන සංඛ්‍යාව 109 සිට 82 දක්වා වැටී ඇත. බදුල්ල, නුවරඑලිය, මහනුවර හා කොලඹ හැරුනු කල එජාපෙ දකුනේ සියලුම මැතිවරන දිස්ත්‍රික්කවලින් පරාජයට පත් විය. ඇමතිවරු 9කට සිය ආසන අහිමි විය.

එජාපෙට එරෙහි මහජන අප්‍රසාදය කෙලින්ම ගලා ආවේ, දිවයින භූගෝලීය ප්‍රාග්ධනය සඳහා ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කරනු පිනිස සාමය ඉල්ලා සිටි, සංගත ප්‍රධානීන්ගේ ඉල්ලීම් පරිදි ක්‍රියාවට දැමූ, පුලුල් ආර්ථික ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් වෙතිනි. පසුගිය වසර දෙකහමාරක කාලය තිස්සේ, එජාපෙ පිලිවෙත්වල ප්‍රතිඵලය වී ඇත්තේ, බඩු මිල නැගීම සහ සහනාධාර, රැකියා හා සමාජ සේවාවන්

කප්පාදුවයි. එම ප්‍රහාර, කම්කරුවන්ගේ, ගොවීන්ගේ, රැකියා විරහිතයන්ගේ හා ශිෂ්‍යයන්ගේ වර්ජන හා විරෝධතා රැල්ලක් අවුලුවාලී ය.

තවත් පක්ෂ දෙකක් ද සැලකිය යුතු වාසි ලබා ගෙන ඇත. එල්ටීටීඊයේ තථ්‍ය නියෝජිතයකු ලෙස ක්‍රියා කරන, දෙමල පක්ෂවලින් සැදි එකතුවක් වන, දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) ආසන 22ක් දිනාගති. බෞද්ධ භික්ෂූන් ඡන්ද අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් කල, සිංහල අන්තවාදී පක්ෂයක් වන ජාතික හෙල උරුමය (ජේඑච්යූ), ආසන 9ක් ජයගෙන ඇත. ප්‍රතිඵලය වී ඇත්තේ. වාර්ගික රේඛා ඔස්සේ තියුනු ලෙස ධ්‍රැවාන්තගත වී ඇති පාර්ලිමේන්තුවකි.

සිංහල ස්වෝත්තමවාදය අවුලුවා, ජවිපෙට උඩ ගෙඩි දීමෙන් අනතුරුව, කුමාරතුංගට දැන් මුහුනදීමට සිදුව ඇත්තේ, පාලනය කර ගත නො හැකි දේශපාලන ගැටලු ගනනාවකට ය. මැතිවරනයෙන් ජවිපෙ ලත් ජයග්‍රහන, ප්‍රථම කොටම, සන්ධානය තැනීම අරභයා ම හේද වූ, ශ්‍රීලනිපය තුල බෙදීම්, තව දුරටත් තියුනු කරනවා ඇත. එපමනක් නො ව, එජනිසයට තව මත් පාර්ලිමේන්තු බහුතරයක් ලබා ගැනීමට ආසන අටක අඩුවක් පවතින අතර ජවිපෙ බලගතු නියෝජනය, සන්ධානයට සහාය පතා ප්‍රවිෂ්ඨ විය හැකි පක්ෂ සම්බන්ධයෙන්, සීමාවන් පනවයි.

එජනිසයේ ආසන 105ට අමතරව, මිලිටරිය සමග සමීපව කටයුතු කර ඇති දෙමල පක්ෂයක් වන ඊලම් ජනතා ප්‍රජාතන්ත්‍ර පක්ෂය (ඊපීඩීපී) දිනා ගෙන ඇති, තනි ආසනය ගැන විශ්වාසය තැබීමට, කුමාරතුංගට හැකි ය. එජාපයේ පෙර සගයන් වන, මුස්ලිම් ජනයා හා දෙමල වතු කම්කරුවන් මත පදනම් වන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය ද ලංකා කම්කරු කොංග්‍රසය හා කඳුරට ජනතා පෙරමුන ද දිනාගැනීමට ඇය ප්‍රයත්න දරනු ඇත. එහෙත් මෙම පක්ෂ, කලින් ප්‍රකාශ කොට ඇත්තේ, තමන් ජවිපෙ සමග ආන්ඩුවකට එක් නො වන බවයි.

එජනිස, ජාතික හෙල උරුමය සමග එකඟතාවකට ඒමට ද උත්සාහ කල හැකි ය. එහෙත් මෙම ආන්තික දක්ෂිනාංශික සංවිධානය සමග ඇති කර ගැනෙන යම් එකඟතාවක්, එල්ටීටීඊය සමග සාම සාකච්ඡා, ගෙන යා නො හැකි තත්වයක් ඇති කරනු ඇත. හෙල උරුමය “සාම ක්‍රියාදාමයට” දෘඩතර ලෙස විරුද්ධ ය. බුද්ධාගමේ හා සිංහල බහුතරයේ අධිපති භාවය සහතික කරන ධර්ම රාජ්‍යයක් බවට ශ්‍රී ලංකාව පත් කල යුතු යයි ද එය අවධාරනය කරයි. එය, ප්‍රධාන පක්ෂවල දූෂිත භාවය හෙලා දකිමින් හා පාර්ලිමේන්තුව “ශුද්ධ කරන” බවට පොරොන්දු වෙමින්, මධ්‍යම පන්තියේ කලකිරුනු ස්ථරවලට ආයාචනා කලේ ය.

හෙල උරුමයට ජාතික මට්ටමෙන් ලැබුනු ඡන්ද ප්‍රමානය සියයට 6ක් වූ අතරම, එය කොලඹ, ගම්පහ, කලුතර හා මහනුවර යන නාගරික දිස්ත්‍රික්කවලින් සැලකිය යුතු ඉහල සහයෝගයක් දිනාගති. හෙල උරුමය සියයට 18ක ඡන්ද ප්‍රමානයක් ලබා ගෙන ආසන තුනක් දිනාගත් කොලඹ දිස්ත්‍රික්කයේ දී, එය, සියයට 29.4ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත් කැස්බෑව හා මහරගම ඇතුලු මැතිවරන කොට්ඨාශ ගනනාවක, එජාපය තෙවන තැනට තල්ලු කලේ ය. මේවා වනාහි. කුඩා ව්‍යාපාරිකයන්, වෙලෙන්දන් හා සෙසු මධ්‍යම පන්තික කන්ඩායම් ඉහල ප්‍රතිශතයකින් වෙසෙන, හෙල උරුමය සිය විෂකුරු ක්‍රිස්තියානි විරෝධී උද්ඝෝෂනය සංකේන්ද්‍රිත කල, නගරාසන්න ප්‍රදේශයන් ය.

සිය සමස්ත ප්‍රතිඵලයෙන් දිරිමත් වූ හෙල උරුමය නායකයෝ, ඉරිදා ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වමින්, තමන් “රටේ ප්‍රධාන පක්ෂය” බවට පත්වන බවට අනාවැකි පල කලහ. පවතින දේශපාලන පක්ෂ දූෂිත ඒවා ලෙස හෙලා දුටු, හෙල උරුමය, තමන් කිසිදු සභාගයක කොටස්කරුවන් නො වන බවත්, එහෙත් සිය ආස්ථානය ඒ ඒ අවස්ථාව මත පදනම්ව තීන්දු කරන බවත් අවධාරනය කලේ ය. හෙල උරුමය සංවිධායක අතුරලියේ රතන හිමිට අනුව, සිය සාමාජිකයන් විපක්ෂය හෝ ආන්ඩු පක්ෂය දෙකින් එකක වත් අසුන් නො ගන්නා පරිදි, පාර්ලිමේන්තුවේ නව ආසන සැලැස්මක් ඇති කල යුතු යයි, පක්ෂය අවධාරනය කරනු ඇත.

එල්ටීටීඊය සම්බන්ධයෙන් ලිහිල් ආකල්පයක් දරන්නේ යයි එජාපෙ හෙලා දැකීමෙන් අනතුරුව, එජනිස, සහාය පතා එල්ටීටීඊයේ සහාය ලැබෙන ටීඑන්ඒ වෙත හැරීමට ඇති ඉඩකඩ ඉතා අඩු ය. ටීඑන්ඒ උතුරේ යාපනය හා වන්නි දිස්ත්‍රික්කවල සියයට 90කට වැඩි ඡන්ද ප්‍රමානයක් ද නැගෙනහිර දිස්ත්‍රික්කවලින් ඊට වඩා අඩු ඡන්ද ප්‍රතිශතයක් ද ලබා ගති. ටීඑන්ඒ ලද ඉහල ඡන්ද ප්‍රමානයන්, යම් දුරකට, උතුරේ හා නැගෙනහිර සෙසු දෙමල දේශපාලන පක්ෂවලට එරෙහි එල්ටීටීඊයේ මැර ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් විය. මැතිවරන කොමසාරිස් එල්ටීටීඊ පාලන ප්‍රදේශවල ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීම ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව, යාපනය හා වන්නි යන දිස්ත්‍රික්ක දෙකෙහිම ඡන්දය දුන් මුලු සංඛ්‍යා අඩු මට්ටමක පැවතුනි -- පිලිවෙලින් සියයට 47.3 හා සියයට 66.3ක් වසයෙනි.

කරුනා නමින් ද හැඳින්වෙන, එල්ටීටීඊයේ නැගෙනහිර මිලිටරි අන දෙන නිලධාරි වී. මුරලිදරන්, සංවිධානයෙන් බිඳී, මාර්තු මුල දී තමන්ගේම අනදෙන ව්‍යුහයක් තනා ගැනීමෙන් පසුව, දෙමල ජාතික සන්ධානය ද හේද වී ඇත. නැගෙනහිර පලාතෙන් ටීඑන්ඒ දිනාගෙන ඇති ආසන 7න් මන්ත්‍රීවරු 5 දෙනෙක් කරුනාට පක්ෂපාතී ය. මෙම හේදය, එල්ටීටීඊ කන්ඩායම් දෙක අතර සන්නද්ධ ගැටුමක් ඇවිලවීමේ ද සාම සාකච්ඡා යලි ඇරඹීමට ඇති ඉඩ ඇහිරීමේ ද තර්ජනය මතු කරයි. එය, ආන්ඩුවක් තැනීමේ දී එජනිස හෝ එජාපෙ මුහුන දෙන අසීරුතාව තවත් සංකීර්න කරයි.

කුමාරතුංග පාර්ලිමේන්තු බහුතරයක් ලබා ගැනීමට සමත් වුවත්, එය අතිශයින් ම අස්ථාවර වනු ඇත. එල්ටීටීඊය සමග සාකච්ඡා පවත්වන්නේ කුමන පදනමක් මත ද යන්න පිලිබඳව, ශ්‍රීලනිපය හා ජවිපෙ අතර මොන යම් හෝ එකඟතාවක් නැත. උතුරු හා

නැගෙනහිර පලාත්වලට සීමිතව බලය බෙදා හැරීම පිනිස, ශ්‍රීලනිප ඉදිරිපත් කල සැලසුම්, ජවිපෙ මීට පෙර, ප්‍රතික්ෂේප කොට ඇත. එමෙන් ම, පුද්ගලීකරන හා ආර්ථික ප්‍රතිව්‍යුහකරන පිළිවෙත් ඉදිරියට ගෙන යන ලෙස, මහ ව්‍යාපාරිකයන්ගෙන් හා මහ බලවතුන්ගෙන් එල්ල වන පීඩනයට මුහුන දීමට, එජනිස ආන්ඩුවකට සිදු වනු ඇත. ජවිපෙ නායකයන්, සංගත ප්‍රභූන් වෙත සිය සහයෝගය දැනටමත් බලගතු ලෙස සංඥා කොට ඇති නමුත්, එවන් පිලිවෙත්. ඔවුනට ඡන්දය දුන් බොහෝ කොටස් ඉක්මනින් ම ඔවුන්ගෙන් විරසක කිරීමට තුඩු දෙනු ඇත.

දේශීය හා විදේශීය අටුවාකරුවන් මැතිවරන ප්‍රතිඵල සර්ව-අශුභවාදී ලෙස පිලිගෙන ඇත යන්න මවිතයට කාරනාවක් නො වේ. නම සඳහන් නො කල ආසියානු තානාපති නිලධාරියෙක් *ඒඑෆ්පී* ප්‍රවෘත්ති සේවයට මෙසේ පැවසී ය: "ශ්‍රී ලංකාවේ දී මෙයට වඩා සටන්කාමී පාර්ලිමේන්තුවක් ලබා ගත හැකි යයි මම නො සිතමි. හරියට ම, එකඟවිය හැකි මධ්‍යස්ථ ආස්ථානයක් අපට සොයා ගත නො හැකිව ඇතුවාක් මෙනි. මෙම නව පාර්ලිමේන්තුවෙන් යමක් කරවාගැනීම අභියෝගයක් වනු ඇත." අරාජක තත්වයක් ඇති විය හැකැයි අනතුරු අඟවමින්, බටහිර තානාපති නිලධාරියෙක් මෙසේ කී ය: "වැදගත් කාරනාව නම්, ඊලඟ පාර්ලිමෙන්තුවට කුමන ආකාරයේ ආයු කාලයක් බලාපොරොත්තු විය හැකි ද යන්නයි."

*සන්ඩේ අයිලන්ඩ්* කතුවැකියක්, තමන් දිගු කාලීනව දරන අදහස වන, ශ්‍රීලනිප හා එජාපය මහා සභාගයක් තැනීමට එක් විය යුතු ය යන ඉල්ලීම, පුනරුච්චාරනය කලේ ය. "මෙම රට වෙනුවෙන් කුමාරතුංගට කල හැකි හොඳම දෙය නම්, ඇය දුර්වල ආස්ථානයක සිට එතරම් දිගු නො වන කලකට ඉහත දී, උත්සාහ කල, ජාතික ආන්ඩුවක් පිහිටුවීමේ එල්ලය ඇතිව ක්‍රියා කිරීමයි." එය අනතුරු ඇඟවීමක් ලෙස මෙසේ ද ප්‍රකාශ කලේ ය: "(යුද්ධයට) සාධාරන හා යුක්තියුක්ත විසඳුමක ආරක්ෂාව වෙනුවෙන් පවත්නා භූගෝලීය සහයෝගය හා ඇමරිකානු ඩොලර් බිලියන 4.5ක ආධාර, දකුනේ ප්‍රධාන ප්‍රවාහයේ පක්ෂ ආත්ම වාසිය උදෙසා තරග වැදීම හේතුවෙන්, අපට අහිමිව යා යුතු නැත."

එජාපෙ ආන්ඩුවට සහයෝගය දී ඇති *සන්ඩේ ලීඩර්* පත්‍රය කනස්සල්ලෙන් යුතුව මෙසේ ප්‍රකාශ කලේ ය: "යන්තම් වසර දෙකක දී, වසර 20ක යුද්ධයෙන් අනතුරුව සාමයට හා ආර්ථික නැග්මකට මග විවර කිරීමේ හැකියාවෙන් යුත්, ජාතියක් ලෙස ජාත්‍යන්තරව පෙනී සිටි රටක්, සෙනසුරාදා වන විට, අවුල් වියවුල් ජාලාවක් අභියස පැද්දෙමින් සිටියේ ය." මෙම අටුවාකරුවා දේශපාලන හිරවීම විසඳාගැනීමේ මාවතක් පෙන්වාලීමෙහි ලා අපොහොසත් විය. ඔහුගේ නිගමනය වූයේ, එජාපෙ, "2001 මැතිවරන ජයග්‍රහනයෙන් පසුව, සහ-පැවැත්මේ නාමයෙන් ජනාධිපති සම්බන්ධයෙන් ලිහිල් ආකල්පයක් ගැනීමට තීන්දු කොට එමගින්, ශ්‍රී ලංකාව ඔද්දල් රටක් බවට පත් කිරීමට කුමාරතුංගට ආධාර හා අනුබල දුන් දිනය පිලිබඳව, කනගාටු වනු ඇති" බවයි.

මැතිවරන උද්ඝෝෂනය පුරාම සමාජවාදී සමානතා පක්ෂය (සසප) අනතුරු ඇඟවූ පරිදි, වත්මන් තත්වය කම්කරු පන්තිය හමුවේ දැවැන්ත අන්තරායන් මතු කරයි. කුමාරතුංග, මිලිටරිය, රාජ්‍ය යන්ත්‍රය සහ සිංහල අන්තවාදී ස්ථරයන් මත වඩා වඩාත් පදනම් වෙයි. ගැඹුරු වන සමාජ හා දේශපාලන ආතතීන් විසඳාලීමෙහි ලා අපොහොසත් වන ඇය, විශේෂයෙන් ම කම්කරුවන්ට හා පීඩිත ජනයාට එරෙහිව එල්ල කෙරෙන, ආඥාදායක පාලන රූපයන්ගේ පිහිට සෙවීමට මැලි නො වනු ඇත.

සිය පොදු පන්ති අවශ්‍යතා සඳහා සටන් වදිනු පිනිස, කම්කරු පන්තිය — සිංහල, දෙමල හා මුස්ලිම් — ස්වාධීනව බලමුලු ගැන්වීම මත පදනම්ව, සමාජවාදී ක්‍රියාමාර්ගයක්, මැතිවරනය තුල දී ඉදිරිපත් කලේ, සසප පමනි. ධනවාදී සූරාකෑම විසින් නිර්මිත වඩ වඩා දරුනු වන කොන්දේසිවලට එරෙහි පොදු අරගලයක් සඳහා කම්කරුවන් ඒකාබද්ධ කිරීමට පදනම දමනු පිනිස, උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු ශ්‍රී ලංකා මිලිටරි හමුදා වහාම ඉවත් කල යුතු යයි, සසප අපේක්ෂකයෝ උද්ඝෝෂනය කලහ. සසප, දකුනු ආසියාවේ හා ජාත්‍යන්තරව සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා හා ඊලම් එක්සත් සමාජවාදී සමූහාන්ඩු සංගමයක් පිහිටුවනු පිනිස සටන් වැදුනි.

සසප, කොලඹ දිස්ත්‍රික්කයට ඉදිරිපත් කල අපේක්ෂක ලැයිස්තුවට ඡන්ද 159ක් ලබා ගනිමින්, ලැයිස්තු 28ක් අතරින් 14 වන තැනට පැමිනියේ ය. මෙම ඡන්ද ප්‍රමානය මගින් පෙන්නුම් කෙරෙන්නේ, තවමත් ඉතා කුඩා වුවත්. කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් යුත් වැදගත් ස්ථරයක්, ශ්‍රී ලංකාවේ නිල දේශපාලන ජීවිතයේ සෑම අංශයක්ම මත ආධිපත්‍යය දරන, වර්ගවාදී දේශපාලනය දැනුවත්වම ප්‍රතික්ෂේප කිරීමට සූදානම් බවයි. එහෙත් එය, වැඩ කරන ජනයාගේ පුලුල් ස්ථරයන් අතර පවත්නා දේශපාලන ව්‍යාකූලත්වය හා ඉදිරිදර්ශන පිලිබඳ අර්බුදය ද තියුනු ලෙස නිරාවරනය කරයි. ප්‍රධාන පක්ෂවලට ගැඹුරින්ම වෛර කරන අතර ම, බොහෝ ඡන්දදායකයෝ, කිසිදු විකල්පයක් දැකීමට අසමත්ව, තමන්ගේ ම පන්ති අවශ්‍යතාවන්ට අති මූලිකව එරෙහි වන ක්‍රියාමාර්ග මත පදනම් වූ පක්ෂවලට, විරෝධතා ඡන්දයක් ප්‍රකාශ කිරීමට තල්ලු වී ඇත.

සසප මැතිවරන ප්‍රකාශය කියවූ, සසප රැස්වීම්වලට සහභාගි වූ නැතහොත් සසප උද්ඝෝෂනය ගැන අවධානය යොමු කල බොහෝ කම්කරුවන්ගෙන්. තරුනයන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් අප ඉල්ලා සිටින්නේ. පක්ෂයේ ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය බැරෑරුම්ව අධ්‍යයනය කරමින් අවශ්‍ය නිගමනය උකහා ගෙන, සසපට බැඳීම සඳහා ඉදිරිපත් වන ලෙසයි.

© www.wsws.org